ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූලි 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් වටිනාකම රු.(21,339,070) ක් විය යුතු වුවද රු.(22,977,221) ක් වශයෙන් රු.1,638,151ක් අඩුවෙන් සඳහන් කර තිබුණු අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි රු.1,638,152ක අග්‍රිම ශේෂයක් පැවතුණද එම වටිනාකමට අදාළව මුදල් ශේෂයක් දක්වා නොතිබුණි.	වෙනසට හේතුව වශයෙන් පෙන්වා ඇත්තේ රු.1,638,151ක නොපියවූ අග්‍රිම ශේෂයක් බවත් එය ජංගම වගකීමක් වන බැවින් අදාල මූල්‍ය තත්ත්වය පිළිබද ප්‍රකාශයේ ජංගම වගකීමක් ලෙස පෙන්වා ඇති බවත් දන්වා තිබුණි.	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 7.9 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් අගය ගණනය කළ යුතු වීම.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතුව පැවති වාහන 06ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර එදිනට අමාත්‍යාංශය සතුව නොපැවැති රු.12,300,000ක වටිනාකමකින් යුතු වාහන 03ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණි.	අදාළ වාහන 06න් එකක් මේ වන විට තක්සේරු කර ඇති බවත් 2025 වර්ෂයේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත් සංස්කෘතික මධ්‍යස්ථානවල ඇති වාහනවලින් එක් වාහනයක් අළුත්වැඩියා කර තක්සේරු කළ යුතු බවත් තවත් වාහන දෙකක් අපහරණය කළ යුතු බවත් දන්වා තිබුණු අතර ජාතික උරුම අංශයට අදාළ අනෙක් වාහන දෙකට අදාළ පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරන බවත් දන්වා තිබුණි.	අමාත්‍යාංශය සතුව පවතින වාහන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අයිතිය පැවරී නොතිබුණු වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) ඇප ලේඛනය		
මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	ඇප ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(ii) නිවාඩු පිළිබඳ ලේඛනය		
ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 ප්‍රකාරව නිවාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	නිවාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 1.7 වගන්තිය ප්‍රකාරව 190 පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව අනුමත කරන ලද නිවාඩු සටහන් කිරිම සඳහා නිවාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ)	අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබු වාහන 02 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි.	1.6.2 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයක් සහ මූලධන වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරන ලද එකතුව රු.8,151,912 ක් වූ ප්‍රතිපාදනවලින් රු.5,352,809 ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 65 සිට සියයට 83 දක්වා පරාසයක් ගෙන තිබුණි.	පසුගිය වර්ෂයේ අඛණ්ඩව ඉන්ධන මිල ඉහළ යාමක් සිදු වීම හේතුවෙන් 101-1-2-0-1202-2 වැය විෂයයට ප්‍රතිපාදන මාරු කළද, අපේක්ෂිත පරිදි ඉන්ධන මිල ඉහළ නොයාම සහ වියදම් කළමනාකරණය නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බවත් මූලධන වැය විෂයය වන 101-02-05-0-2102 සඳහා මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු වූයේ 2024 වර්ෂ අවසානයේ බැවින් අදාළ කාර්යයන් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් කාලයක් දිස්ත්‍රික් ලේකම්වරුන්ට නොමැති බව නිරීක්ෂණය වූ බැවින් ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව ප්‍රතිපාදන මාරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.1,100,000ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.600,000ක් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයකට මාරු කර තිබූ අතර ඉතිරි ප්‍රතිපාදිත මුදල ද අදාල අරමුණ වෙනුවෙන් වැය කර නොතිබුණි.	අමාත්‍යාංශ ලේකම්ගේ 2024 පුනරාවර්තන වියදම් පාලනයට අදාළ ලිපිය ප්‍රකාරව, මෙම වැය විෂයය යටතේ වූ ප්‍රතිපාදනයෙන් අවුරා තබන ලද ප්‍රමාණය රු.500,000ක් වූ බවත් 101-02-05-0-1304 වැය විෂයය යටතේ අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවූ බවත් දන්වා තිබුණි.ඒ අනුව එම ඉතිරි ප්‍රතිපාදනය, ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථානවල නිලධාරීන්ගේ ගමන් වියදම් ගෙවීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් යොදා ගෙන සිදු කරන භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට අදාළ	ප්‍රතිපාදිත මුදල්, වර්ෂය තුළ ප්‍රතිපාදිත අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතු වීම.

		ගමන් වියදම් ගෙවීම් කිරීමට 101-02-05-0-1101 වැය විෂයයට මු.රෙ.66 යටතේ මාරු කරන ලද බවත් දන්වා තිබුණි.	
(ඇ)	මූලධන වැය විෂයයන් දෙකක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් මාරු කරන ලද එකතුව රු.41,541,657ක් වූ ප්‍රතිපාදනවලින් රු.26,771,010 ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 55 සිට සියයට 69 දක්වා පරාසයක පැවතුණි.	මූලධන වැය විෂයයක් වන 101-02-05-37-2104 සඳහා රු.33,690,000ක ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන් කරවා ගෙන ඇති අතර මුළු ප්‍රතිපාදනය රු.38,690,000ක් හා ඉතිරි ශුද්ධ ප්‍රතිපාදනය රු.21,339,053ක් වන අතර ඩබ්.ඩී.අමරදේව අසපුව ඉදි කිරීම් කටයුතු සිදු කිරීමේදී, ඇතැම් මිලදී ගැනීම් සඳහා කිහිප වරක් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සිදු වීමත් සහ ඇතැම් සැපයුම්කරුවන් අදාළ ද්‍රව්‍ය ඉදිකිරීම් පරිශ්‍රයට භාර දීමට දීර්ඝ කාලයක් ගත කිරීමත් හේතුවෙන් ප්‍රතිපාදන නියමිත කාලසීමාව තුළ භාවිතා කිරීම සීමා වූ බව දන්වා තිබුණි.	වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වීම.
(ඈ)	මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් නොමැති මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින්ද රු.5,037,326ක ප්‍රතිපාදන ලබා ගෙන වර්ෂය අවසානයේ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.	101-2-5-49-2509 මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා වෙන්කරන ගන්නා ලද වැය විෂයයක් බවත් රංගිරි-දඹුලු විහාර සංරක්ෂන කාර්යය සඳහා විදේශ ප්‍රදානයක් ලෙස ලැබුණු රු.5,037,326ක ප්‍රතිපාදනය සඳහා මෙම වැය විෂය ස්ථාපිත කලද එම ව්‍යාපෘති කාර්යය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් බිල්පත් ඉදිරිපත් නොකිරීම මත ජාතික උරුම අංශය විසින් අක් මුදල් ලබාගැනීමට කටයුතු සිදු නොකරන ලද බවත් දන්වා තිබුණි.	මධ්‍යම සංස්කෘතික අරමුදලට ප්‍රතිපාදන ලබා දී අදාළ විදේශ ප්‍රදානය ලබා දුන් අරමුණු වෙනුවෙන් මුදල් යෙදවීමට අමාත්‍යාංශය කටයුතු කළ යුතු වීම.

(ඉ)	පුනරාවර්තන වැය විෂයයන් හතළිහක් (40) ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.167,060,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.95,495,612ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට සියයට 97 දක්වා පරාසයක් ගෙන තිබුණි.	අපේක්ෂිත වියදම් ඉදිරිපත් නොවීම, වියදම් පාලනය කිරීම, මුදල් කළමනාකාරිව හා අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සහ ප්‍රමුඛතාවය දිය යුතු අත්‍යාවශ්‍ය වියදම් පමණක් දැරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි.	නිසි මුදල් කළමනාකාරීත්වය හා අරපිරිමැසුමින් භාවිතා කිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම.
(ඊ)	මූලධන වැය විෂයයන් අටක් (08)ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.160,700,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.137,405,940ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට සියයට 99 දක්වා පරාසයක් ගෙන තිබුණි.	දහම්පාය ගොඩනැගිල්ලේ වහලය මත සූර්ය පැනල සවි කිරීම සඳහා අදාල තාක්ෂණික ඇගයීම් කටයුතු ප්‍රමාද වීම , අමාත්‍යාංශය යටතේ ඇති සියළු දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති බවත් අදාළ දෙපාර්තමේන්තු මගින් ප්‍රතිපාදන ඉල්ලීම් ඉදිරිපත් නොවූ බැවින් වියදම් පාලන චක්‍රලේඛනවලට අනුගත වීම, ඉලක්කගත ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම,ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මු.රෙ.208 මගින් ප්‍රතිපාදන පැවරුවද වියදම් වාර්තා නොවීම, සැලසුම් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කලද එම වැඩසටහන් නේවාසිකව සිදු නොකිරීම මත වියදම් සීමාවීම, තාක්ෂණික ගැටළු ආදී හේතු මත ඉතිරිවීම් සිදු වූ බව දන්වා තිබුණි.	වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වීම.
(උ)	පුනරාවර්තන වැය විෂයයන් දහයක් (10) ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.7,140,000ක් හා මූලධන වැය විෂයයන් තුන (03)ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.1,002,200ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක:01/2024 අනුව වියදම් පාලනය කිරීම, අපේක්ෂිත පරිදි අවශ්‍යතා පැන නොනැගීම, විදේශ ගමන් වියදම් සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලය මගින් දන්වා ඇති පරිදි කටයුතු කිරීමට සිදු වීම නිසා මෙම වැය විෂයයෙහි මුදල් කළමනාකාරිව හා අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට සිදු වීම, මෙම වැය	වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වීම.

		විෂයයට අදාළ ප්‍රතිපාදන අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය (අමරදේව අසපුව) ව්‍යාපෘතියෙහි නඩත්තු සහ මෙහෙයුම් වියදම් සඳහා වෙන් කර ඇති නමුත් එම වියදම් සිදු නොවීම ආදී හේතු දක්වා තිබුණි.	

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයට අයත් මූලධන වැය විෂයයන් දෙකක් සඳහා වෙනත් දෙපාර්තමේන්තු දෙකක් (වැය ශීර්ෂ අංක 258 හා 265) මඟින් එකතුව රු.84,560 ක් වූ බැරකම් පහක් සිගාස් වැඩසටහනෙහි අමාත්‍යාංශයේ බැදීම් බැරකම් ලේඛනයට ඇතුළත් කර තිබුණි.	අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ මෙම මුදල බැරකම් ලෙස ඇතුලත් කර නොමැති අතර, වෙනත් වැය ශීර්ෂ දෙකක් විසින් මෙම වැය විෂයයන් සඳහා බැරකම් ගිණුම් ගත කර ඇත. අදාල වැය ශීර්ෂ වෙතින් විමසීම් කර පසුව පිලිතුරු සපයන බව දන්වා තිබුණි .	මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව තොරතුරු ඇතුළත් කළ යුතු වීම.
(ආ)	මුදල් රෙගුලාසි 211(i) සහ මු.රෙ.447 ප්‍රකාරව සියලුම බැරකම් ඒවා සිදු වූ වහාම බැරකම් ලේඛනයේ සටහන් කළ යුතු වුවත්, 2024 වර්ෂයේදී අමාත්‍යාංශයේ ගෙවීම් වවුචර් 26කට අදාළව ගෙවන ලද එකතුව රු.3,541,342 ක් 2025 වර්ෂයේ මුල් මාස 03 තුලදී ගෙවීම් කර තිබුණද බැදීම් බැරකම් ලේඛනයෙහි බැරකම් ලෙස ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.	බැදීම් හා බැරකම් නව සිගාස් වෙබ් යෙදුම වෙත 2025.01.31 හෝ ඊට පෙර උඩුගත කළ යුතු වන බැවින් බැරකම් ලේඛනයට ඇතුළත් කරන ලද්දේ එදිනට ඇති බැරකම් ශේෂයන් පමණක් බවත් 2025 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී අදාළ සියලු බැදීම් හා බැරකම්, බැරකම් ලේඛනයේ නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.	සියළුම බැදීම් බැරකම්, බැරකම් ලේඛනයෙහි ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අදාළ සමාලෝචනය ලිඛිතව ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කළ බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ii)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	නිරීක්ෂණය හා එකඟ වන බවත් 2024 සිව්වන කාර්තුව තුළදී ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීමත්, වරින් වර අමාත්‍යාංශයට අයත් ආයතන සංශෝධනය වීමත් හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බවත්, 2025 ජනවාරි මාසයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරන ලද බවත් එම තත්ත්වය අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා බවත් දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නිරීක්ෂණය			ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ				
2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ				
• 3.1 වගන්තිය	-	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහන 44 ක් සම්බන්ධයෙන් විගණිත දිනය වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2024 වර්ෂය වෙනුවෙන් සියලුම වාහන වෙනුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කර ඇති බවත් (බාහිර පාර්ශවවලට වෙන් කර ඇති වාහන 05 හැර) 2025 වර්ෂය වෙනුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට සැලසුම් කර ඇති බවත් දන්වා තිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
• 3.3 වගන්තිය	-	ඉන්ධන භාවිතයේ වෙනසක් ඇත්නම් එය හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයේ ඇමුණුම 01හි සඳහන් පරිදි ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් අමාත්‍යාංශයට අදාල වාහන 26 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	දැනට බුද්ධශාසන අංශයට අයත් වාහන 26 සඳහා මාසිකව ප්‍රවාහන සේවා සටහන් සම්පූර්ණ කර පවත්වා ගෙන යාම සිදුවන බව දන්වා තිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.5 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශයේ පොදු තැන්පතු ගිණුම් 03කට අදාළව එකතුව රු.56,304,096ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) හා (3) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු පිළිබඳව අවසන් තීරණයක් මෙතෙක් ගෙන නොමැති බැවින් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළ රැඳවුම් තැන්පතුද, අමරදේව අසපුව ඉදිකිරීම් කටයුතු මේ වන විටත් සිදු කෙරෙමින් පවතින බැවින් ඊට අදාළ රැඳවුම් තැන්පතුද 6000-0-0-16-0-73 (කොන්ත්‍රාත් සඳහා රැඳවුම් තැන්පතු) පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු ශේෂයක් ද වැඩ අවසන් කර නොමැති විද්‍යාලංකාර පිරිවෙනෙහි නව ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාල රැඳවුම් මුදලක් ද නිදහස් කර නොමැති බව දන්වා තිබුණි.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) හා (3) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 දෙසැම්බර් 31 දිනැති අංක 09/2019 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා 209 අග්‍රිම ගිණුම් අංකයද ගිණුම් අංක 7040101 දරන ලංකා බැංකුවේ නිල බැංකු ගිණුම් අංකය පමණක් හඳුන්වා දී තිබියදී ඊට අමතරව අමාත්‍යාංශය විසින් ගිණුම් අංක 7040782 සහ ගිණුම් අංක 7040115 දරන බැංකු ගිණුම් දෙකකට ප්‍රධාන ගිණුමෙන් වරින් වර මුදල් මාරු කර තිබුණි. උප කාර්යාල සඳහා නිල බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ	අමාත්‍යාංශයේ, සංස්කෘතික කටයුතු අංශයට අයත් 7040782 අංක දරන නිළ බැංකු ගිණුම 2015 වර්ෂයේ මාර්තු 10 දින ආරම්භ කර සංස්කෘතික කටයුතු අංශයේ නිල බැංකු ගිණුම වශයෙන් පවත්වා ගනිමින් 2015 ඔක්තෝබර් 23 දිනෙන් නිකුත් වී ඇති 03/2015 අංක දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව දක්වා ඇති ආකෘතින් යටතේ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අනුමැතීන් ලබා ගෙන ඇති අතර	අදාළ අනුමැතීන් ලබා ගෙන ඇති බව දන්වා තිබුණද,එය සාවද්‍ය වන අතර 2015 ඔක්තෝබර් 23 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 02.1 ජේදය ප්‍රකාරව නව බැංකු ගිණුම් විවෘත කිරිම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වීම.

2015 ඔක්තෝබර් 23 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 03/2015 හි 02.1 ප්‍රකාරව ලබා ගත් අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශය සඳහා වන නිල බැංකු ගිණුමෙන් වෙනත් බැංකු ගිණුම් සඳහා මුදල් මාරු කිරීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ විගණනයට සහතික විය නොහැකිය.	අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලට අයත් ලංකා බැංකුවේ අංක 7040101 ගිණුමෙන්, සංස්කෘතික කටයුතු අංශයට අදාලව පැවැති ලංකා බැංකුවේ අංක 7040782 දරන නිල බැංකු ගිණුමට මුදල් මාරු කර ගනිමින් කාර්යක්ෂමව හා කඩිනමින් මූල්‍ය කළමනාකරණ කටයුතු සිදු කර ඇති බව දන්වා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි විසර්ජන පනත යටතේ වැය ශීර්ෂයෙන් අනුමත වී ඇති සියළුම අමාත්‍යාංශ විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. ඒ අනුව 101 වැය ශීර්ෂය යටතේ ඇති බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා එක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හා එක් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, බුද්ධශාසන අංශය, සංස්කෘතික අංශය හා උරුම අංශය සඳහා වෙන් වෙන් වශයෙන් වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් 03ක් හා ක්‍රියාකාරී සැලසුම් 03ක් පිළියෙල කර අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබුණි.	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ උපදෙස් පරිදි 2024 වර්ෂය සඳහා සමස්ත අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකසා ඇති බවත්, ඇමිණීමේ පහසුව සඳහා පමණක් (Binding) වෙන වෙනම කොටස් 03 ක් ලෙස අමුණා ඇති බවත් ඒකාබද්ධ ප්‍රසම්පාදන සැලැස්මක් 2026 වර්ෂයේ සිට සකස් කිරීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි.	අමාත්‍යාංශය සඳහා එක් ක්‍රියාකාරී සැලැස්මක් හා එක් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර සකස් කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්	2026 වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා කාලයකට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරිමට	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

	අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි.	කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කළ බව දන්වා තිබුණි.	
(ඇ)	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව 101-2-5-44-1409 වැය විෂයය යටතේ කලා සංස්කෘතික කඳවුරු දෙකක් පැවැත්වීම සඳහා රු.මිලියන 3.3 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද, රු.මිලියන 0.64 ක් පමණක් වැය කරමින් මෙම සංස්කෘතික කඳවුරු දෙක පවත්වා තිබුණි. ඒ අනුව, මෙම වැඩසටහන් සඳහා නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.	පිළිතුරු ජාතික උරුම අංශයෙන් ලැබුණ පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.
(ඈ)	ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය පිහිටුවීමේ අරමුණු වන සාම්ප්‍රදායික අස්පර්ශනීය හා පාරම්පරික උරුමයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය, එම උරුමයන් මතු පරපුර වෙත දායාද කිරීමට අවශ්‍ය නිර්මාණශීලී පියවර ගැනීම, උරුමයන්හි මූලයන් ශක්තිමත් කිරීම හා ඒවායේ නියැලි ශිල්පීන්ට අභිමානයක් ලබා දීම සහ අස්පර්ශනීය උරුමයන් පිළිබඳ ලොව දැනුවත් කිරීම යන අරමුණු ලඟා කර ගැනීමට ප්‍රමාණවත් වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.	පිළිතුරු ජාතික උරුම අංශයෙන් ලැබුණ පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන අයුරින් නිසි අධ්‍යානයකින් යුතුව ක්‍රියාකාරී සැලැස්මට වැඩසටහන් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු වීම.
(ඉ)	කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය කිරීමට අදාළව ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම, සාම්ප්‍රාදායික උඩරට ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන ග්‍රාමීය වැව් හා වාරිමාර්ග පද්ධති නඟා සිටුවීම, සාම්ප්‍රදායික පැරණි කර්මාන්ත සංවර්ධනය හා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම හා එම කර්මාන්ත	පිළිතුරු ජාතික උරුම අංශයෙන් ලැබුණ පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	නිසි අධ්‍යානයකින් යුතුව ක්‍රියාකාරී සැලැස්මට වැඩසටහන් ඇතුලත් කිරීමට කටයුතු කල යුතු වීම.

සංරක්ෂණය හා ප්‍රවර්ධනය වැනි අරමුණු ඉටුකර ගැනීම සඳහා කන්ද උඩරට උරුමය පදනම ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා ප්‍රමාණවත් වැඩසටහන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව 101-2-5-44-1409 වැය විෂයය යටතේ ආදිවාසි ගම්මානවල සමාජ සජීවීකරණ වැඩසටහන් සිදු කිරීම හා ජාතික උරුමයන් සඳහා පර්යේෂණ හා සංරක්ෂණ කමිටුව පවත්වාගෙන යාම සඳහා පිළිවෙලින් රු.මිලියන 1.7 ක හා රු.මිලියන 0.3 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද, වර්ෂය තුළ එම කාර්යයන් සිදුකර නොතිබුණි.	පිළිතුරු ජාතික උරුම අංශයෙන් ලැබුණු පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාළ කාර්යයන් වර්ෂය තුළ සිදු කළ යුතු වීම.
(ආ)	ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය මගින් 2024 වර්ෂය තුළ රු.250,000ක ප්‍රතිපාදනයකින් මූර්ති නිර්මාණය පිළිබඳ නව පාඨමාලාවක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, එම කටයුතු සිදුකර නොතිබුණි.	පිළිතුරු ජාතික උරුම අංශයෙන් ලැබුණු පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාළ කාර්යයන් වර්ෂය තුළ සිදු කළ යුතු වීම.
(ඇ)	101-2-5-037-2104 වැය විෂයය යටතේ අමරදේව අසපුව ඉදි කිරීම සඳහා රු.මිලියන 38.69 ක වාර්ෂික ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද රු.මිලියන 17.351 ක කාර්යයන් පමණක් වර්ෂය තුළදී ඉටු කර තිබුණි. තවද, මෙම අසපුවේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණ ද එහි අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කර ගැනීම සඳහා 101-2-5-037-1509 වැය විෂයය යටතේ රු.මිලියන 5 ක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි. එසේ වුවද, එහි කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන භාවිතයෙන් තොරව පැවතුණි.	ඩබ්.ඩී.අමරදේව අසපුව ඉදි කිරීමේදී, ඇතැම් මිලදී ගැනීම් සඳහා කිහිප වරක් ප්‍රසම්පාදන කටයුතු කිරීමට සිදු වීම, ඇතැම් ද්‍රව්‍ය ඉදිකිරීම් පරිශ්‍රයට භාර දීමට දීර්ඝ කාලයක් ගත කිරීම ආදී කරුණු හේතුවෙන් ප්‍රතිපාදන නියමිත කාලසීමාව තුළ භාවිත කිරීම සීමා වූ බවත්, අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය ව්‍යාපෘතියෙහි නඩත්තු සහ මෙහෙයුම් වියදම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන, ඩබ්.ඩී.අමරදේව අසපුව ආයතනයක් ලෙස ස්ථාපනය කර නොමැති නිසා වියදම් නොවූ බවත් දන්වා තිබුණි.	වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වීම.

(ඇ)	අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන දහම් පාය ගොඩනැගිල්ලේ වහලය මත සූර්ය පැනල සවි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.14,200,000 ක් වෙන් කර ගෙන අදාළ ඉල්ලුම් පත්‍ර වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට රු.8,500ක් සහ පුවත්පත් දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු.178,416ක් වශයෙන් රු.196,916ක් වැය කර තිබූ අතර ප්‍රතිපාදන වෙන් කර ගත් කාර්යය ඉටු කර නොතිබුණි.	යෝජිත මහලේ සූර්ය පැනල සවි කිරීමට ප්‍රථම වහළය අළුත්වැඩියා කළ යුතු බවට පැන නැගුණු තාක්ෂණික නිර්දේශ මත වහළය (slab) අළුත්වැඩියාවට ප්‍රමුඛතාවය දීමට සිදු වූ අතර ඒ අනුව කටයුතු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි.	ප්‍රතිපාදනයක් සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථම ඒ සඳහා සුදුසු පරිසරයක් තිබේද යන්න අධ්‍යයනයකින් යුතුව එය සිදු කළ යුතු වීම.
(ඉ)	අමාත්‍යාංශයට අයත් සියළු දෙපාර්තමේන්තු හා ආයතන වල මෘදුකාංග සංවර්ධනය සඳහා රු.35,000,000ක මූලධන ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද එම කාර්යය ඉටු කිරීම සඳහා රු.1,600,000 ක් මුස්ලිම්, ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණි. ඊට අමතරව, මෘදුකාංග සංවර්ධනයට අදාල නොවන ත්‍රිපිටකයේ මහාවග්ග පාලි ග්‍රන්ථය ඉංග්‍රීසියට පරිවර්ථනය කිරීම හා මුද්‍රණය කිරීම වෙනුවෙන් මේ සඳහා වෙන් කර ගත් මුදලින් රු.184,797ක් වැය කර තිබුණු අතර ප්‍රතිපාදිත මුදල අපේක්ෂිත කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි.	අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති සියළුම දෙපාර්තමේන්තුවල මාදුකාංග සංවර්ධනයට මෙම ප්‍රතිපාදන වෙන් වුවද අදාළ දෙපාර්මේන්තුවලින් ඒ සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරිවූ බව දන්වා තිබුණි.	අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් සිදු කර වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියා කළ යුතු වීම.
(ඊ)	බෞද්ධ විහාරස්ථාන සඳහා සූර්යබල විදුලිය ලබාදීමේ වැඩසටහනක් සඳහා අමාත්‍යාංශය විසින් රු.1,075,000ක මුදලක් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කර ගෙන තිබුණද රු.314,352ක් වැය කර ඊට අදාළ ඉඩම මැනීමේ කාර්යය පමණක් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ අතර ඉතිරි කාර්යයන් කිසිවක් සිදු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන තිබූ ඉඩමේ සිට විදුලි උපපොලට විදුලිය ඇදීම සඳහා රු.මිලියන 742ක් වැය වන බැවින්, විදුලි ගාස්තු ලාභයෙන් අදාළ වියදම වසර 10ක් තුළ ගෙවා නිම කිරීමට හෝ සුනීත්‍ය බලශක්ති අධිකාරිය මඟින් සුදුසු වෙනත් ඉඩමක් සොයා ගැනීමට උත්සහ දරමින් සිටින බව දන්වා තිබුණි.	ප්‍රතිපාදනයන් සිදු කර ගැනීමට පෙර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය පිළිබඳ අධ්‍යයනයක් සිදු කර තීරණ ගැනීම සිදු කළ යුතු වීම.

4.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා 101-02-05-31-2509 වැය විෂයය යටතේ රු.මිලියන 27.58 ක් වෙන් කර තිබුණු අතර එයින් රු.මිලියන 7.746ක් ඉතිරි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නේවාසික නාට්‍ය හා රංග කලා පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කර නොතිබුණු අතර ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ස්වයං ලිඛිත චරිතාපදාන සංග්‍රහය, මානව ග්‍රන්ථ කියවීම සහ සමාජ සමානාත්මතා ආකල්ප ප්‍රවර්ධන ළමා කතා පොත් නිර්මාණය යන වැඩසටහන් සම්පූර්ණ කර නොතිබුණි.	මානව ග්‍රන්ථ කියවීමට අදාළ වැඩසටහන 2024 දෙසැම්බර් මස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ආබාධිත ප්‍රජාවගේ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රවර්ධන කාර්යාංශය පැවති ස්ථානයෙන් ඉවත්කර වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම හේතුවෙන් ක්ෂණිකව අදාළ වැඩසටහනෙහි සංවිධාන කටයුතු සිදු කර ගැනීමට නොහැකි වූ බවත්, 2025 සැප්තැම්බර් මස බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ වාර්ෂික ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශන භූමියේදී පැවැත්වීමට මූලික කටයුතු කර ඇති බවත් දන්වා තිබුණි. තවද, ස්වයං ලිඛිත චරිතාපදාන සංග්‍රහය මුද්‍රණයට අදාළ සැපයුම්කරු චරිතාපදාන සංග්‍රහය යුනිකෝඩ් අක්ෂරවලින් මුද්‍රණය කිරීමේ හැකියාව නොමැති බව දැනුම්දී තිබූ බැවින් නැවත වෙනත් සැපයුම්කරුවකු තෝරාගැනීමට කාලයක් නොමැති බැවින් 2025 වසරේ මාර්තු මාසයේදී නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කර මුද්‍රණ කටයුතු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති බව දන්වා තිබුණි. සමාජ සමානාත්මතා ආකල්ප ප්‍රවර්ධන ළමා කතා පොත් නිර්මාණය යටතේ ආබාධ සහිත දරුවන් හා එම වැඩිහිටි ප්‍රජාව පිළිබඳ දරුවන් තුළ සමානාත්මතා ආකල්ප ජනිත කරවීම සහ එම ආකල්ප වැඩිදියුණු කිරීමේ වැඩසටහනට අදාළව, පුවත්පත් දැන්වීම් පළකිරීමෙන් අනතුරුව, ළමා සාහිත්‍ය කෘති නිර්මාණ 40 ක් පමණ ලැබී තිබුණු බවත්, ප්‍රශස්ථ කෘති 10 ක් තේරාගෙන ඔවුන් වෙත මුදල් ත්‍යාග පිරිනමා ඇති බවත් අධ්‍යාපන උපකාරක ග්‍රන්ථ ලෙස මෙම කෘතිවල ප්‍රකාශන කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අදහස් විමසා ඇති බවත් දන්වා තිබුණි.	ප්‍රතිපාදනයන් ඉල්ලුම් කිරීමට පෙර අදාළ කාර්යය සිදු කර ගැනීමට සුදුසු වාතාවරණයක් පවතිද යන්න පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කළ යුතු වීම.
(ආ)	ඉහත කාර්යයන්වල ඇතුලත් කර තිබූ අස්පර්ශනීය උරුමයන් ආරක්ෂිත කිරීම යටතේ අස්පර්ශ උරුමයන් පිළිබඳ සුරක්ෂණ සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද, ආන්තික ප්‍රජාවන් බලගැන්වීම සඳහා පවත්වන සමාජ සංස්කෘතික වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සංක්‍රාන්තික ප්‍රජාව සමාජයේ පුරවැසියන් ලෙස පිළිගැනීමට ලක් කිරීම යන වැඩසටහන ක්‍රියාත්මක	අස්පර්ශනීය උරුමයන් ආරක්ෂා කිරීම යටතේ අදාළ කටයුතු සඳහා පිහිටුවා ගන්නා ලද කමිටුව ඊට අදාළ කාර්යයන් පිළිබඳ සාකච්ඡා සිදු වෙමින් පවතින කාලවකවානුව තුළදී පැවති පාලන තන්ත්‍රය වෙනස්වීම මත එම කමිටුව අහෝසිවීම හේතුවෙන් අදාළ කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදුවූ බවත්, අස්පර්ශ උරුමයන් පිළිබඳ සුරක්ෂණ සැලැස්ම ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරගෙන යනු ලබන බවත් දන්වා තිබුණි. 2024 වර්ෂය තුළ සංක්‍රාන්තික ප්‍රජාව සඳහා සංස්කෘතික වැඩසටහන් සැලසුම් කර තිබුණද, එමගින් සදාචාරාත්මක වශයෙන් සහ නීතිමය වශයෙන් ගැටළු රාශියක් මතුවන තත්ත්වයක් පැවතුණු හෙයින් හා ජන සමාජය හා මාධ්‍යය වෙතින්	පූර්ව අධ්‍යයනයකින් යුතුව සැලසුම් සකස් කළ යුතු වීම.

	කර නොතිබුණි.	විරෝධතා මතුවිය හැකි බැවින් එම වැඩසටහන ක්‍රියාත්මක නොවූ බවත් ඒ වෙනුවට ආන්තික ප්‍රජාවන් බලගැන්වීම යටතේ දරුදැරියන් ඇතුළු ප්‍රජාව සඳහා ආකල්ප සංවර්ධන හා රසඥතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණු අතර 2025 වර්ෂයේ ද අඛණ්ඩව එම වැඩසටහන් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබන බවත් දන්වා තිබුණි.	
(ඇ)	101-2-05-2103 වැය විෂයය යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 12.26 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබූ අතර සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සහ මධ්‍යස්ථාන 218 ක් සඳහා ඇඹිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය තුලදී රු.මිලියන 9.69ක ප්‍රතිපාදන පමණක් වැය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 2.55ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුලදී සංස්කෘතික මධ්‍යස්ථාන 50 ක් සඳහා පමණක් ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගෙන තිබුණි.	විශාල ප්‍රමාණයක් එකවර සැපයීමට දීර්ඝ කාලයක් ගත වන බැවින් පළමු අදියර යටතේ ඇඟිලි සලකුණු යන්ත්‍ර 50ක් පමණක් මිල දී ගත් බවත්, ඉතිරි යන්ත්‍ර 43ක් මේ වසරේ පළමු කාර්තුවේ සපයාගෙන සවි කරන ලද බවත්, තවදුරටත් ඉතිරි වී ඇති යන්ත්‍ර 127ක ප්‍රමාණයක් මේ වසර තුළ දී මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව මුදල් ප්‍රතිපාදනය කර ගැනීමට වග බලා ගත යුතු වීම.
(ඇ)	101-2-05-09-1409-099 වැය විෂයය යටතේ රු.මිලියන 19 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණු අතර විවිධ උත්සව සඳහා සංස්කෘතික අංග ඉදිරිපත් කිරීමට අමතරව විවිධ සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද එයින් රු.මිලියන 15.312 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව සැලසුම් කල පරිදි ප්‍රවර්ධන වැඩසටහන් නොපැවැත්වීම නිසා රු.මිලියන 3.688 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	2024 වර්ෂයේ මුල් මාසවලදී විවිධ උත්සව හා සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබා දීම සිදු කර ඇති අතර වර්ෂය අගදී පැවැත්වුණු මැතිවරණ කටයුතු හේතුවෙන් බොහෝ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන/මුදල් ලබාදීම සිදුනොවීම, එම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුවී ඇති බව දන්වා තිබුණි.	ප්‍රතිපාදන ඉල්ලීම් කළ බවට ලිඛිත සාක්ෂි නිරීක්ෂණය නොවුණි. නිසි අධ්‍යයනයකින් යුතුව මුදල් ප්‍රතිපාදනය කර ගැනීමට වග බලා ගත යුතු වීම.

4.4 **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 වර්ෂයේදී අපහරණය කළ යුතු බවට නිර්දේශ කර තිබූ අමාත්‍යාංශයේ මෝටර් කාර් රථයක අපහරණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි.	හැකි ඉක්මණින් අපහරණ කටයුතු අවසන් කර විගණනයට වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා තිබුණි.	වත්කම් අපහරණ කටයුතු කඩිනමින් නිම කළ යුතු වීම.
(ආ)	2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව, වාහන දැනට පරිහරණය කරනු ලබන ආයතනයට අයිතිය ලබා ගැනීමට නොහැකි අවස්ථාවලදී වාහනයේ ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, අමාත්‍යාංශයට අයත් එකතු වටිනාකම රු.49,000,000 ක් වූ වාහන දෙකක් සම්බන්ධයෙන් ප්‍රවර්තන වර්ෂයේදීත් එලෙස කටයුතු කර නොතිබුණි.	වාහන දෙකෙහි ලියාපදිංචි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 03/2018 අනුව කටයුතු කරන බව දන්වා තිබුණි.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ඇ)	අමාත්‍යාංශය යටතේ පාලනය වන රජරට චාරිකා නිවාසය පිහිටි ඉඩම හා එම ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දිනය වන විටත් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ඉඩම හා එම ගොඩනැගිල්ල අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු අවසන් අදියරේ පවතින බව දන්වා තිබුණි.	ඉඩම හා එම ගොඩනැගිල්ල අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඈ)	2005 වර්ෂයේදී ආරම්භ කර රු.මිලියන 1249.93ක වියදමකින් 2019 වර්ෂයේදී නිම කර තිබූ වර්ග මීටර් 9847 ක වපසරියකින් යුත් විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව 2023 වර්ෂයේදී විද්‍යාලංකාර භාරය වෙත භාරදී තිබුණි.		
	• 2017 වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබී 2019 වර්ෂයේදී නිම කර තිබුණ ද, වර්ෂ දෙකකට අධික ප්‍රමාද කාලය වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතනය වූ	තවදුරටත් කරුණු සොයා බලමින් පවතින බැවින් ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	අදාළ ආයතනයෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම.

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.		
• වායුසමීකරණ යන්ත්‍ර, සීසීටීවී කැමරා පද්ධතිය, ශබ්ද විකාශන යන්ත්‍ර යනාදී සවිකිරීම් ක්‍රියාවිරහිතව පැවතියද ඒවා යථාවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාළ සවිකිරීම් වරින් වර සේවා කිරීමට අවශ්‍ය නමුත් 2017 වර්ෂයේ රු.මිලියන 200 ක ප්‍රතිපාදන වෙන් වුවද අක්මුදල් නොමැති වීම හේතුවෙන් CECB ආයතනය වෙත ගෙවිය යුතු වූ බිල්පත් පවා ගෙවීමට නොහැකි වී ඇති බවත්, මෙම ව්‍යාපෘතියේ VI අදියරේ වැඩ නිම කිරීමට ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කළ ද ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බවත් දන්වා තිබුණි.	ක්‍රියාවිරහිත වී ඇති වායුසමීකරණ යන්ත්‍ර, සීසීටීවී කැමරා පද්ධතිය, ශබ්ද විකාශන යන්ත්‍ර යනාදිය යථාවත් කිරීමට කටයුතු කළ යුතු වීම.
• නිසි අනුමත සැලසුම් අනුව ගොඩනැඟිලි ඉදි කිරීමෙන්, සිදු විය හැකි ආපදාවන් අවම කර ප්‍රමිතියෙන් යුතු ගොඩනැඟිලි ඉදිකිරීම සිදු කළ යුතු වුවද,වර්ග මීටර් 9847ක විශාල වපසරියකින් යුත් මෙම ගොඩනැඟිල්ලට අදාළ මූලික සැලසුම් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භයේදී ඒ සඳහා අනුකූලතා වාර්තාව නාගරික සංවර්ධන හා ජල ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ලබා ගත යුතු වුවත් ලබාගෙන නොතිබූ බව 2021 වර්ෂයේදී අනාවරණය වීමෙන් පසු ගොඩනැගිල්ල සඳහා අනුකූලතා වාර්තාව 2023.03.15 දිනැතිව මෙම අමාත්‍යාංශය විසින් ලබාගෙන ඇති බව දන්වා තිබුණි.	සැලසුම් අනුමත කරවා ගෙන ඒ අනුව ඉදි කිරීම් කළ යුතු වීම.
• එක් එක් අයිතම සඳහන් කරමින් ගොඩනැඟිල්ල භාර දීම සිදු කර තිබුණද, අදාළ ලේඛන ද සම්පූර්ණ කර නොතිබූ අතර භාර ගත් බවට ලිඛිත සනාථ කිරීමක් ද විද්‍යාලංකාර භාරය වෙතින් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ලිපියක් මගින් ඉන්වෙන්ට්‍රියක් (Handing Over List) ගෞරවනීය ස්වාමීන් වහන්සේ වෙත යොමු කර ඇති බවත් විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව සේවා සැපයුම් තත්ත්වයට පත් කිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව විද්‍යාලංකාර භාරය පිහිටුවා භාර ඔප්පුවක් මගින් 2020.10.15 දින අත්සන් තබා විද්‍යාලංකාර භාරයට භාර දී ඇති බවත් දන්වා තිබුණි.	අදාළ භාරය විසින් ගොඩනැගිල්ල විධිමත් පරිදි භාර ගත් බවට ලිඛිත සනාථන ලබා ගත යුතු වීම.
• පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් තොරව ගොඩනැඟිල්ල විද්‍යාලංකාර භාරය වෙත භාරදී තිබුණද, අඩුපාඩු සම්පූර්ණ කිරීමේ හැකියාවක් විද්‍යාලංකාර භාරය වෙත පවතීද යන්න සනාථ කර ගෙන නොතිබූ අතර මෙම	විද්‍යාලංකාර භාරය සඳහා පත්වී ඇති නව සාමාජිකයන් විසින් මෙම ව්‍යාපෘතිය ආදායම් උත්පාදන තත්ත්වයට පත් කිරීම සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කර ඉදිරිපත් කර ඇති බවත් එම සැලැස්ම අනුව විද්‍යාලංකාර භාරය	අඩුපාඩු සම්පූර්ණ කරවා ගෙන ගොඩනැගිල්ල කඩිනමින් භාවිතයට ගත යුතු වීම.

	වාර්තාවේ දිනය වන විටත් ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි.	විසින් පළමු වසර දෙක සඳහා ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රම සඳහන් කර ඇති අතර එම වසර දෙක අවසානයේදී තෙවන අදියර ලෙස ගොඩනැගිල්ලේ අරමුණට ගැලපෙන පරිදි ක්‍රියාත්මක කරන බව ද අමාත්‍යාංශය වෙනුවෙන් ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු හා බිල්පත් සහතික කිරීම සඳහා ඉංජිනේරුවරයෙකුගේ සේවය අවශ්‍ය වූවත් දැනට අමාත්‍යාංශයේ ඉංජිනේරුවරයකු නොමැති බැවින් ඒ සඳහා වෙනත් ආයතනයක ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව ද දන්වා තිබුණි.	
(ඉ)	මහා නායක චාරිකාරාම පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ල 2023 අගෝස්තු 29 දිනැති අංක MBRCA/O1/07/52-01 දරන ලිපිය මගින් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරන බව දන්වා තිබුණද, විධිමත් ලෙස දෙපාර්තමේන්තුව වෙත පැවරීම සිදු කර නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල ලිපියක් මඟින් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇති බවත් ඉන්වෙන්ට්‍රි පරීක්ෂා කර භාර දීම තාක්ෂණ නිලධාරි තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ප්‍රමාදව ඇති බවත් දන්වා තිබුණි. තාක්ෂණ නිලධාරි පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බැවින් බඳවා ගැනීමෙන් අනතුරුව විධිමත්ව පවරා දීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති බවත් දන්වා තිබුණි.	ගොඩනැගිල්ල විධිමත් ලෙස දෙපාර්තමේන්තුව වෙත පැවරීම සිදු කළ යුතු වීම.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 12 වන අධිකාරියට අනුකූලව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් 20 දෙනෙකුගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	දැනට සිදු කරනු ලබන ඇප අයකිරීම් පරීක්ෂා කිරීමේදී සියළුම මාණ්ඩලික නිලධාරීන් ඇතුළත් කරගෙන තිබුණද රියදුරන් ඇතුළත්ව නොමැති බව නිරීක්ෂණය වන බැවින් ඉදිරියේදී රියදුරන් ඇතුළත් කර ගැනීමට සටහන් කර ගෙන ඇති බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී අමාත්‍යාංශයේ සිදුවූ A4 ප්‍රමාණයේ ඡායා පිටපත් සොරකමට අදාළව රජයට සිදුව තිබූ රු.320,450ක් වූ අලාභයෙන් රු.8,011ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන ඇති අතර ඉතිරිය වන රු.312,439ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරියාගෙන් වාරික වශයෙන් අය කිරීම දැනට ද සිදු වන බවත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු ලබා ඇති සේවකයාගෙන් අයකර එවන ලෙස දන්වා තිබුණද මෙතෙක් අයකර එවා නොමැති බැවින් නැවත දැන්වීමට කටයුතු කරන ලද බවත් දන්වා තිබුණි.	අලාභය අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 3.1 ඡේදයේ මු.රෙ. 113(6) (ආ) යටතේ අත්තිකාරම් "බී" ගිණුම මඟින් ලබා දුන් ණය හෝ අත්තිකාරම් මුදල් අය කර ගැනීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ අංක 01හි විධිවිධාන පරිදි කටයුතු කිරීමෙන් තොරව, වසර 1- 3 අතර කාලයක් පවතින මියගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.263,003ක එකතු ණය ශේෂයක්, විශ්‍රාම ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු රු.200,763ක එකතු ණය ශේෂයක්, සේවය අතහැර ගොස් සිටින නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.266,990ක එකතු ණය ශේෂයක්, වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.354,530ක එකතු ණය ශේෂයක් සහ වසර 10 ක් ඉක්මවූ විශ්‍රාම ගිය නිලධාරීයෙකුගෙන් අයවිය යුතු රු.128,372ක ණය ශේෂයක්, සේවය අතහැර ගොස් සිටින නිලධාරීයෙකුගෙන් අයවිය යුතු රු.96,130ක ණය ශේෂයක්, වැඩ තහනම් කළ නිලධාරීයෙකුගෙන්	අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ණය මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.5, 4.3,4.4,4.5 සහ 4.6 උපවගන්ති හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අදාළ මාර්ගෝපදේශ අංක 01හි විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම.

	අයවිය යුතු රු.110,650ක ණය ශේෂයක් ද පැවතුණි.		
(ඇ)	විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.24,080 ණය ශේෂයක්ද, වැඩ තහනම් කල නිලධාරීන් 6 දෙනෙකුගෙන් අය විය යුතු රු.148,205 ක එකතු ණය ශේෂයක් ද වශයෙන් එකතුව රු.172,285 ක ණය ශේෂයක් සම්බන්ධයෙන් 2024 මැයි 29 දිනැති අංක 1 /2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.	විශ්‍රාම වැටුප සැකසීමේදී මතු වී ඇති ගැටලු නිරාකරණය කර ගැනිමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බවත්, විශ්‍රාම වැටුප් සකස් කර විශ්‍රාමික නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරනු ඇති බවත් දන්වා තිබුණි.වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ, ගෙවන ලෙස දන්වා ලිපි යොමු කර ඇති බවත් ඇපකරුගෙන් අයකරගැනිමට ඇති හැකියාව සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි. ඇපකරුවන්ද නොමැති උත්සව අත්තිකාරම් සඳහා හිඟ මුදල ගෙවන ලෙස ලිපියකින් දැනුම් දි තිබෙන බවත්, වසර 07 ක කාලයක සිට පැවත එන හිග ණය ශේෂයක් බැවින් මුදල් චක්‍රලේඛ 01/2020 හි විධිවිධාන සංශෝධනය යටතේ ණය මුදල කපා හැරිමට යෝජනා කරන බවත් දන්වා තිබුණි.	2024 මැයි 29 දිනැති අංක 1 /2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම.
(ඈ)	2021 පෙබරවාරි 16 දිනැති අමප/21/0191/305/007 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය සඳහා 11 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගෙන තිබුණද විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 14 දින වන විටත් සිව් දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් පමණක් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ඉ)	2021 නොවැම්බර් 02 දිනැති අමප/21/1883/305/007-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පවතින වත්කම් ඵලදායි අයුරින් උපයෝජනය කිරීම හා මහජනතාව ආකර්ෂණය වන අයුරින් අපේ ගම පරිශ්‍රය ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර තිබුණද, විගණිත දින වන විටත් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබූ අතර අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය ආරම්භක අවධියේ පැවති ආදායම් මාර්ග මත පමණක් පදනම් වී මෙහෙයුම් කටයුතු සිදු කර තිබුණි.	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතු වීම.
(ඊ)	2024 සැප්තැම්බර් 10 දිනැති අමප/24/1687/620/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇති ඉඩම්වල විභවතාව සලකා ආයෝජන ව්‍යාපෘතියක් ලෙස හෝ රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස මූල්‍ය ස්වාධීනත්වයකින් යුක්තව පවත්වාගෙන යාම සඳහාත් දැනට උත්පාදනය කරනු ලබන ආදායමින් වියදම් ආවරණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමටත් කටයුතු කළ යුතු වුවද විගණිත දිනය වූ 2025 සැප්තැම්බර් 30 වන විටත් ඒ සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර උපයන ආදායම රජයේ ආදායමට බැර කර, ජනකලා කේන්ද්‍රය සඳහා වෙන් කර ඇති වැය විෂයය යටතේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම හරහා වියදම් පියවා ගැනීමට කටයුතු කරමින් අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතු වීම.
(උ)	2024 දෙසැම්බර් 31 දිනට අපේ ගම පරිශ්‍රය තුළ ඉදිකරන ලද වෙළඳ කුටි 45 න් වෙළඳ කුටි 18 ක් අලෙවිකරුවන්ට ගිවිසුම්ගත වීමකින් තොරව රු.1,000 ක මාසික කුලියක් මත ලබා දී තිබූ අතර එම වෙළෙඳ කුටි භාවිතා කිරීමේදී සිදුවන හානි සම්බන්ධයෙන් ආරක්ෂිත තැන්පතුවක්ද ලබා ගෙන නොතිබීමෙන් රාජ්‍ය දේපළ වලට යම් හානියක් සිදුවුවහොත් එය අයකර ගැනීමට ක්‍රමවේදයක් නොතිබුණි. එමෙන්ම මාසිකව අදාළ කුලී මුදල් නිසි පරිදි අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් ද	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	වෙළඳ කුටියක මාසික කුලී වටිනාකම නිසි පරිදි තක්සේරු කර කුලී අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් කඩිනමින් සකස් කළ යුතු වීම.

	සකස් කර නොතිබුණු අතර ඉහළ වෙළඳ වටිනාකමක් සහිත භූමියක පිහිටි මෙම වෙළඳ කුටි සඳහා මාසික කුලිය ලෙස රු.1,000 ක් නියම කර තිබීම ද ගැටළු සහගත විය.		
(ඍ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය අනුව රාජ්‍ය ආයතන විසින් මහජනතාවට සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15ක උපරිමයකට යටත්ව සංශෝධනය කළ යුතු වුවද අපේගම සම්බන්ධයෙන් එසේ සංශෝධන සිදු කර නොතිබුණි.	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(එ)	අංක 20 සිට 28 දක්වා වන වෙළඳ කුටි 9 ක් ශිල්ප සභාවට ලබා දී තිබුණද, ඒ සඳහා ගිවිසුම්ගත වීමක් සිදු කර නොතිබුණු අතර අදාළ වෙළඳ කුටි ලබා දීම සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	වෙළඳ කුටි ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු වීම.
(ඒ)	අපේ ගම පරිශ්‍රයේ පිහිටි පුරාණ ගම කොටස නරඹන්නන් සඳහා විවෘත කර පවත්වා ගෙන යාමට හැකි වන පරිදි සකස් කල යුතු වුවද, එම කටයුතු විධිමත් පරිදි සිදු කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර මේ හේතුවෙන් ටිකට් පත් අලෙවි කිරීමෙන් උපයාගත හැකිව තිබූ ආදායම වසර කිහිපයක සිට අහිමි වී තිබුණි.	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	අපේ ගම පරිශ්‍රයේ පිහිටි පුරාණ ගම කොටස නැවත නරඹන්නන් සඳහා විවෘත කිරීමෙන් රජයේ ආදායම වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඔ)	මු.රෙ. 127(අ) අනුව ආදායම් එකතු කිරීම පිළිබඳ ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කර ඇති බවට වගබලා ගැනීම පිණිස විධිවිධාන යෙදීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද, අපේ ගම පරිශ්‍රය විසින් දෛනිකව එකතු කරන සියළුම මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර නොතිබුණි.	ජාතික උරුම අංශයෙන් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කළ යුතු වීම.
(ඕ)	මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව අලාභහානියක් සිදු වූ විට පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා දින 07කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි	ඉදිරියේදී මුදල් රෙගුලාසි 104(04) ප්‍රකාරව අලාභ හානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළත	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

	අපේක්ෂා කරන්නේ නම් වහාම ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වන අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභයක් සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද, 2024 ජනවාරි 01 දින එක් මෝටර් රථයකට සිදුව තිබූ අනතුරකට අදාළව ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර අනතුර සිදුවී මාසයකට අධික කාලයක් ගතවීමෙන් පසු 2024 පෙබරවාරි 07 දින පූර්ණ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. තවද, එක් මෝටර් රථයකට 2023 අගෝස්තු 15 දින සිදුව තිබූ අනතුර සම්බන්ධයෙන් වන පූර්ණ වාර්තාව අනතුර සිදු වී මාස 08ක් ඉක්මවීමෙන් පසුවද, තවත් මෝටර් රථයකට 2023 දෙසැම්බර් 13 දින සිදුව තිබූ අනතුර සම්බන්ධයෙන් වන පූර්ණ වාර්තාව අනතුර සිදුවී මාස 04ක් ඉක්මවීමෙන් පසුව ද ඉදිරිපත් කර තිබුණි.	අවසාන වාර්තා ඉදිරිපත් කිරීමට සටහන් කරගෙන ඇති බව දන්වා තිබුණි.	
(ක)	අමාත්‍යාංශය විසින් පූජාභූමි සංවර්ධනය සඳහා 2023 සහ 2024 වර්ෂවලදී පිළිවෙලින් රු.20,130,247ක් සහ රු.24,926,805ක් බැගින් ප්‍රතිපාදන ලබා දී තිබුණද පූජාභූමි සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘති තෝරා ගැනීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ හෝ ඒ හා සම්බන්ධ චක්‍රලේඛ නිකුත් කර නොතිබූ අතර විහාරස්ථාන සංවර්ධනය සඳහා 2023 වර්ෂයේ දී නිර්ණායක තුනක් යටතේ පූජාභූමි 14ක් ද 2024 වර්ෂයේ දී වෙනත් නිර්ණායක පහක් යටතේ පූජාභූමි 10 ක් ද සංවර්ධනය කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබුණි. තවද, අදාළ වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් නොවීම, විහාරාධිපති ස්වාමීන් වහන්සේලා දැනුවත් නොවීම, ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ අඩුපාඩු හා ප්‍රමාද වී ප්‍රතිපාදන නිදහස් කිරීම යනාදී හේතූන් නිසා ඇතැම් ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වී වර්ෂය අවසානයේදී මුදල් ආපසු එවා තිබූ අවස්ථා පැවතුණි.	2023 සහ 2024 වර්ෂවලට පෙර වර්ෂවල පූජාභූමි ප්‍රතිපාදන නිදහස් කිරීමේදී කිසිදු නිර්ණායකයක් මත පදනම්ව මුදල් නිදහස් කර නැති අතර 2023 වර්ෂයේදී වියදම් පාලන චක්‍රලේඛ, අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි අත්‍යාවශ්‍ය ප්‍රමුඛ කාර්යයන් සඳහා පමණක් ප්‍රතිපාදන නිදහස් කර කරන ලද බවත් දැනට ප්‍රමාදයන් වළක්වා ගනිමින් ව්‍යාපෘති ඉටු කිරීමට හැකි කාලයක් ලබා දෙමින් ප්‍රතිපාදන නිදහස් කිරීමට පියවර ගෙන ඇති බව දන්වා තිබුණි.	පූජාභූමි සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා නිර්ණායක අනුමත කර ගත යුතු වීම, අදාළ සංවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට හා ප්‍රතිපාදන ප්‍රමාදයකින් තොරව නිදහස් කිරීමට කටයුතු කළ යුතු වීම.

(ග)	ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීම වෙනුවෙන් 2023 වර්ෂයේ රු.මිලියන 101.15ක් වැය කර තිබූ අතර විහාරස්ථාන තෝරා ගැනීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත පත් කරන කමිටුවක් මඟින් සිදු කර තිබුණද එම කමිටුව පත්කිරීම හා සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් හෝ ඊට අදාළ අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ අනුමත කර ගෙන නොතිබුණු අතර වර්ෂ කිහිපයක සිට සලකා බලන ලද නිර්ණායක පදනම් කර ගෙන විහාරස්ථාන තෝරා ගනු ලබන බව අමාත්‍යාංශය විසින් දන්වා තිබුණද විෂය භාර අමාත්‍යවරයා සහ ලේකම්වරයා වෙතින් ඉදිරිපත් වී ඇති විශේෂ ඉල්ලීම් සලකා බැලීමට බොහෝ අවස්ථාවල තීරණය කර තිබූ අතර 2023 වර්ෂයේ ප්‍රතිපාදන ලබා දී තිබුණු ග්‍රාමීය විහාරස්ථාන 148ක් අතුරින් විහාරස්ථාන සංවර්ධන ව්‍යාපෘති 65ක් සඳහා පමණක් තේරීම් කමිටුවේ නිර්දේශ ලබාගෙන ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉතිරි විහාරස්ථාන සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත සිදු කර තිබුණි. තේරීම් කමිටුව විසින් සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට තීරණය කර තිබුණ ද තීරණය කරන ලද අවස්ථාව වන විටත් සංවර්ධනය කිරීමට අදාළ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර නොතිබුණු විහාරස්ථාන පැවති අතර අමාත්‍යාංශය විසින් විහාරස්ථාන අමතා අදාළ අයදුම්පත්‍ර හා ව්‍යාපෘතිවලට අදාළ ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණි. ඒ අනුව ආධාර අත්‍යාවශ්‍ය විහාරස්ථාන තෝරා ගැනීමේදි නිර්ණායක පදනම් කර ගෙන විනිවිදභාවයකින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	මෙම වැඩසටහන වර්ෂ ගණනාවක් පුරා ක්‍රියාත්මක වන වැඩසටහනක් බවත් නිර්ණායක මූලිකව අනුමත කළ ගොනුවක් ඉදිරිපත් කිරීම අපහසු වන අතර 2024 වර්ෂය තුළ නැවත අදාළ නිර්ණායක සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබූ අතර විෂයභාර අමාත්‍යවරයා විසින් ලබා දෙන ලද ඉල්ලීම් සඳහා විහාරස්ථාන තේරීම් කමිටුවේ නිර්ණායකවලට අනුව ප්‍රතිපාදන ලබා දිය නොහැකි අවස්ථාවල අදාළ විහාරස්ථානයේ ඇති නිර්ණායකවලට අනුගත වෙනත් සංවර්ධන යෝජනාවක් පිළිබඳ තොරතුරු ගෙන්වා ගෙන ඒ සඳහා ප්‍රතිපාදන නිකුත් කිරීමට කටයුතු කරන ලද බවත් දන්වා තිබුණි.	අනුමත විධිමත් නිර්ණායකයන්ට අනුව අදාල වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වීම.

(ව)	අමාත්‍යාංශය, බුද්ධශාසන හා ආගමික කටයුතු, සංස්කෘතික හා ජාතික උරුම වශයෙන් කොටස් තුනක් ලෙස පවත්වා ගෙන යනු ලබන අතර අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව ද අදාල කොටස් තුන යටතේ ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, අමාත්‍යාංශය පිහිටුවීමට අදාළ 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන ගැසට් නිවේදනයේ සඳහන් පරිදි අමාත්‍යාංශයට අදාළ කාර්යයන්, දැක්ම, මෙහෙවර සහ අරමුණු පොදුවේ හඳුනා ගෙන නොතිබුණු අතර අදාළ අංශවලට වෙන වෙනම කාර්යයන්, දැක්ම, මෙහෙවර සහ අරමුණු හඳුනා ගෙන තිබුණි.	ඉදිරියේදී කාර්යසාධන වාර්තාව අමාත්‍යාංශය ලෙස එක් වාර්තාවක් ලෙස සකස් කිරීමට කටයුතු කරන අතර එහිදී අමාත්‍යාංශය වෙනුවෙන් එකම දැක්මක්, මෙහෙවරක් සහ අරමුණු සකසා වාර්තාව සකස් කිරීමට සටහන් කර ගන්නා බව දන්වා තිබුණි.	අමාත්‍යාංශයට අදාළව ඒකීය දැක්මක්, මෙහෙවරක් සහ අරමුණු තිබිය යුතු වීම.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් 2024 වර්ෂය සඳහා අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට සටහන් කරගෙන ඇති බව දන්වා තිබුණි.	පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තියේ විධිවිධාන හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක්	නිරීක්ෂණය හා එකඟ වන බවත් 2024 සිව්වන කාර්තුව තුළදී ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීමත්, වරින් වර අමාත්‍යාංශයට අයත් ආයතන සංශෝධනය වීමත් හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බවත්, 2025 ජනවාරි මාසයේදී විගණන	පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය විසින් රැස්වීම් දෙකක් පමණක් පැවැත්වීමට කටයුතු කර තිබුණි.

හා කළමනාකරණ කමිටු රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරන ලද බවත් එම තත්ත්වය අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා බවත් දන්වා තිබුණි.